# ඉපැරණි විහාර ආශ්‍රිත උද්භිද සැරසිලි කලාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඩී. දිල්හානි ඉන්ද්‍රචාපා[1], පූජ්‍ය කෝන්කොටන්මුල්ලේ සංකිච්ච හිමි [2]**

දේශීය කලා නිර්මාණ අතර හඳුනාගත හැකි සුවිශේෂී අංගයක් ලෙස පාරම්පරික සැරසිලි රටා හඳුනාගත හැකිය. පැරණි සැරසිලි කලාව සිතුවම්, කැටයම් සහ කලාශිල්ප කේන්ද්‍රකරගනිමින් ආරම්භ වී ඇති අතර ඒවා පැරණි විහාර ආශ්‍රිතව බහුලව හඳුනාගත හැකිය. එහිදී උද්භිද සැරසිලි කලාවට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ විහාර සිතුවම් ආශ්‍රිතව යොදාගෙන ඇති උද්භිත සැරසිලි පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ ඉපැරණි විහාර ආශ්‍රිතව යොදා ගෙන ඇති උද්භිද සැරසිලි කලාවේ ලක්ෂණයන් කෙබඳු ද යන්න පිරික්සීමයි. මෙහිදී අධ්‍යයන ක්‍රමවේද වශයෙන් පුස්තකාල අධ්‍යයනය, ක්ෂේත්‍ර ගවේශණ ඔස්සේ තොරතුරු රැස්කරන ලදි. උද්භිද ගණයට විවිධ මල් වර්ග හා කොළ වර්ග අයත් වේ. මල් වර්ග අතරින් බිනර මල, ගැටපෙති මල, අන්නාසි මල, ඇසළ මල, සීන මල, කඩුපුල් මල හා පිච්ච මල එකී ගණයට අයත් වේ. මීට අමතරව ස්වස්තික මල හා නාග ලෝකයට අයත් මල් විශේෂයක් ලෙස සැලකෙන කඩුපුල් මල් හා මනඃකල්පිත මල් ද සිතුවම් කලාවේ දී භාවිත කර ඇත. බහුලව යොදාගත් මල් විශේෂයක් ලෙස නෙළුම් මල සිතුවම් කලාවට මෙන්ම කැටයම් කලාවේ දී එක ලෙස යොදාගත් උද්භිද ගණයේ මෝස්තරයකි. එසේම නෙළුම් මලේ පෙතිවල ස්වාභාවය තුළ නෙළුම් මල් වර්ග කිහිපයක් හඳුනාගත හැකිය. පාරම්පරික සැරසිලි කලාව තුළ දී බහුල වශයෙන් අන්නාසි මල යොදාගෙන ඇත. මෙය බොහෝ විට පැරණි ශිල්පියා විසින් උද්භිද ගණයට අයත් මල් විශේෂ නිර්මාණය කිරීමේ දී තාත්විත බවින් මිදී තම අභිමතය පරිදි නිරූඪ කොට යොදාගත් බව ඉන් පෙනේ. මීට අමතරව මානෙල්, ඕලූ, සපු මල, බෙරලිය මල, ඇසල මල, නාගදල්ල, එසේම සිතුවම් කලාව තුළ දැකගත හැකි පත්‍ර වර්ග කිහිපයකි. පෙරළුම් කොළය, කොළ සුළිය, විචිත්‍ර කොළය, ගැට ලියපත, පතුරු ලියපත, කෙළ ඉරුව ආදී කොළ වර්ග දැකගත හැකිය. ඊට අමතරව උඩරට හා පහතරට විහාරස්ථාන ආශ්‍රිතව විවිධ කොළ වර්ග කිහිපයක් හඳුනාගත හැකිය. මෙහි නිගමනය වන්නේ පැරණි විහාර ආශ්‍රිතව නිර්මාණය වූ මෙම උද්භිද සැරසිලි කලාව සිතුවම්, ලී කැටයම්, පාරම්පරික කර්මාන්ත ආශ්‍රයෙන් බහුලව හඳුනාගත හැකි අතර ඒ ඒ මල් වර්ග යොදා ගැනීමේ විවිධ හේතුන් ද දක්නට ලැබේ. එමෙන්ම ස්වාභාවික, අර්ධ ස්වාභාවික, මනඃකල්පිත වශයෙන් ද සිතුවම් තුළ අවකාශීය භාවිතය සඳහා ද උද්භිද සැරසිලි කලාව භාවිත කර ඇත.

**ප්‍රමුඛ පද :** උද්භිද, සැරසිලි කලාව, කැටයම්, විහාර, මනඃකල්පිත

[1 2] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.*dilhaniindrachapa@gmail.com*